# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2090/18 - 2018 සැප්තැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2018.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2017

### 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත

1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 26 වන වගන්තිය යටතේ සෞඛ්‍යය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍යය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2018 අංක 01 දරන ශ්‍රී ලංකා හෙද සභා (සභා සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි සුදුසුකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) පනතේ 3 වන වගන්තියේ (ii), (iii), (iv) සහ (v) වන උපවගන්තිවල කාර්යය සඳහා ''නියමිත පශ්චාත් උපාධි සුදුසුකමක්'' යන යෙදුම මගින් අදාළ හෙද ක්ෂේත්‍රයේ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත යම් විශ්වවිද්‍යාලයක් විසින් ප්‍රදානය කරන ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, මාස්ටර්ස් උපාධියක් හෝ ආචාර්ය උපාධියක් (පී.එච්.ඩී) අදහස් විය යුතු ය.

(ආ) එකී පශ්චාත් උපාධි සුදුසුකම ඇති කිසිඳු තැනැත්තකු නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා හෙද සභාව විසින් පනතේ 3 වන වගන්තියේ (ii), (iii), (iv) සහ (v) වන උපවගන්තිවල කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි පිළිවෙලින්, පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් නිකුත් කරන ලද ඉගැන්වීම හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ මහජන සෞඛ්‍යය හෙදකම පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ රෝහල් වාට්ටු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා හෙද සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනයම් සුදුසුකමක් පිළිගනු ලැබිය හැකි ය.

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල -

''පනත'' යන්නෙන් 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත අදහස් වේ ;

''පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල'' යන්නෙන් සූතිකා පුහුණුව හෝ මානසික හෙදකම සහ ඉගැන්වීම සහ අධීක්ෂණය, වාට්ටු කළමනාකරණය සහ අධීක්ෂණය සහ මහජන සෞඛ්‍ය හෙදකම සහ අධීක්ෂණය ඇතුළත් මාස දහ අටක කාලසීමාවක ඩිප්ලෝමාවක් (පශ්චාත් ප්‍රාථමික ඩිප්ලෝමාවක්) සහ හෙදකම සම්බන්ධ ඇනෙකුත් ඩිප්ලෝමා සහ විශේෂිත හෙද පුහුණු පාඨමාලාව සඳහා හෙද/හෙදියන් පුහුණු කරන්නා වූ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වන පුහුණු ආයතනය අදහස් වේ.

10 - 317

1A - PG 4248 — 517 (2018/09)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*